# 2006 වර්ෂය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ පාලන වාර්තාව

1. හැඳින්වීම:

මුදල් අමාත්‍යාංශයේ මෙහෙයවීම සහ මාර්ගෝපදේශකත්වය යටතේ සුරාබදු දෙපාර්තමේන්තුව, රජයේ ප්‍රතිපත්ති හා ඒවාට අදාල සුරාබදු ආදායම් සුරැකීම හා එකතු කිරීම ඇතුළු කටයුතු සඳහා නෛතික අධිකාරය ලැබෙන්නේ ප්‍රධාන වශයෙන්ම ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 52 වෙනි අධිකාරිය වන සුරාබදු ආඥා පණතෙනි. මේ හැරුණ විට, 1999 අංක 8 දරණ දුම්කොළ බදු පණතෙහි අධිකාරිය පවත්වා ගැනීමේ වගකීම හා පොලිස් හා වෙනත් අදාල නියෝජිතායතනයන් සමග, වස, විෂ, අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණතෙහි අධිකාරිය බලාත්මක කිරීමේ සාමූහික වගකීමද දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනිවාර්ය කාර්යයෝ ය. පූර්වෝක්ත ආඥා පණත් හා පණත්වල සහ ඒවාට අනුසාංගික නීති, රෙගුලාසි, නිවේදන, නියෝග හා විධාන ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ බලධාරී ප්‍රධාන පෙළේ නියෝජිතායතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. රජයේ ආර්ථික සංවර්ධන කටයුතු සඳහා වැය කිරීමට සැලකිය යුතු අය සම්භාරයක් රැස්කර දීමෙන් හා එකී ව්‍යවස්ථාවන් යටතේ ගැනෙන සෑම ආකාරයකම වැරදි වැලක්වීමෙන් හා ග්‍රහණය කිරීම තුලින් සමාජ ආරක්ෂාව සැලසීමෙහි සුවිශේෂ ජාතික මෙහෙවරක් ඉටු කිරීමේ කාර්යයක සුරාබදු දෙපාර්තමේන්තුව නිරත වෙයි.

2. ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ, නීත්‍යානුකූල නොවන මත්පැන් හා මත්ද්‍රව්‍ය වලින් තොර නීරෝගිමත් සමාජයක් ගොඩනැගීමට දායක වීම.

3. මෙහෙවර

ශ්‍රී ලංකාවේ සුරා. හා දුම්කොළ කර්මාන්තයන්හි කාර්යක්ෂම පාලනයක් තුලින් ආදායම එකතු කිරීමෙනුත්, මෙකී කර්මාන්තවල නීත්‍යානුකූල නොවන නිෂ්පාදනයන් වැලැක්වීමෙනුත්, ශ්‍රී ලංකාවේ සංවර්ධනයට හා සමාජ සුභ සාධනයට දායකවීමත්, වස විෂ, අබිං අන්තරාදායක ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීමෙන් සමාජ ආරක්ෂාව ලබා දීමත් ය.

පරමාර්ථයන් :

අ. මත්පැන් හා දුම්කොළ වලින් ලැබෙන ආදායම ආරක්ෂා කර ගැනීම.
ආ. සුරාබදු ආඥා පණත හා දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
ඇ. වස, විෂ, අබිං අන්තරාදායක ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීම.

ක්‍රියාකාරකම් :

අ. බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය , පාලනය හා ඒවායින් ලැබිය යුතු ආදායම එකතු කිරීම.
ආ. සුරාබදු ආඥා පණත සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම.
ඇ. දුම්කොළ නිෂ්පාදනාගාර අධීක්ෂණය හා පාලනය ඇතුළුව දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
ඈ. වස, විෂ, අබිං අන්තරාදායක ඖෂධ ආඥා පණත බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම

4. සංවිධාන ව්‍යුහය

2006.12.31 වන දිනට කාර්ය මණ්ඩලය මෙසේ විය:-

| | | |
|---|---|---|
| සුරාබදු කොමසාරිස් ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (පුහුණු / අපරාධ) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (ආදායම් / පාලන) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අභ්‍යන්තර විගණන) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| සහකාර සුරාබදු කොමසාරිස් | : | 08 |
| පරිපාලන නිලධාරි | : | 01 |
| සුරාබදු අධිකාරි | : | 12 |
| ප්‍රධාන සුරාබදු පරික්ෂක | : | 35 |
| සුරාබදු පරික්ෂක | : | 158 |
| සුරාබදු සැරයන් මේජර් | : | 26 |
| සුරාබදු සැරයන් | : | 77 |
| සුරාබදු නියාමක / කෝප්‍රල් | : | 478 |
| සුරාබදු රියදුරු | : | 61 |
| රාජ්‍ය කළමනාකාර සහකාර සේවය | : | 92 |
| අයවැය සහකාර | : | 01 |
| කාර්යාල සේවක සේවය | : | 37 |
| බංගලා භාරකරු | : | 03 |

5. **මාණ්ඩලික වෙනස්කම්:**

2006 වර්ෂය තුලදී පහත නම් සඳහන් නිලධාරීන් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

| | | | | |
|---|---|---|---|---|
| ආර්.එම් කරුණාතිලක මහතා | - | සහකාර සුරාබදු කොමසාරිස් | - | 2006.01.02 |
| ජ්.ජ් දයාරත්න මහතා | - | ප්‍රධාන සුරාබදු පරික්ෂක | - | 2006.01.02 |
| වී.ජ් හේරත් මහතා | - | ප්‍රධාන සුරාබදු පරික්ෂක | - | 2006.10.10 |

ප්‍රධාන සුරාබදු පරික්ෂක, එච්. අනුර ශාන්ත මහතා 2006 අගෝස්තු මස 30 වන දින අභාවප්‍රාප්ත විය.

2006 වර්ෂය තුල පහත සඳහන් උසස් කිරීම් සිදු කරන ලදී

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක පී/15/24/61/05 හා 2006.08.02 දිනැති ලිපියෙන් පහත නම් සඳහන් සුරාබදු අධිකාරිවරුන්, සහකාර සුරාබදු කොමසාරිස් තනතුරුවලට 2006 අප්‍රියෙල් 17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කරන ලදී.

- ටී. වසන්ත කුමාර මහතා
- යූ.ජ් මොහොමඩ් මහතා
- එස්.ඩී.එල් ද මැල්ලව මහතා
- ඩබ්.එම්.එම්.බී වන්සූරිය මහතා
- ජ්. බෝදරගම මහතා
- එම්.ඩී.එම්.ඩබ්.කේ දිසානායක මහතා
- බී.ජ් දයාරත්න මහතා

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක පී/15/24/61/05 හා 2006.09.13 දිනැති ලිපියෙන් සුරාබදු අධිකාරි ජේ.පී සිල්වා මහතා, සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට 2006.4.17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කරන ලදී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක පී/15/24/55/05 හා 2006.09.19 දිනැති ලිපියෙන් පහත නම් සඳහන් ප්‍රධාන සුරාබදු පරික්ෂකවරුන්, සුරාබදු අධිකාරි තනතුරට 2006.05.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කරන ලදී.

- එම්.ආර් ගෝමස් මහතා
- බී. ක්‍රිස්ටි ජෝශප් මහතා
- බී.යූ වික්‍රමරත්න මහතා
- යූ.ජී නයනානන්ද මහතා
- ජේ. ශාන්තදේව මහතා

6. මානව සම්පත් සංවර්ධනය:

පහත සඳහන් නිලධාරීන් සඳහා පුහුණු වැඩ සටහනන් පනාදරගම සුරාබදු අභ්‍යාස විද්‍යාලයේදී පවත්වන ලදී.

| දිනය | කාලය | නිලධාරීන් |
|---|---|---|
| 2006.01.28 - 2006.01.30 | දින 03 | සියළුම සුරාබදු නිලධාරීන් |
| 2006.02.03 | දින 01 | -එම- |
| 2006.02.05 - 2006.02.10 | දින 06 | සුරාබදු නියාමකවරුන් |
| 2006.02.11 | දින 01 | සියළුම සුරාබදු නිලධාරීන් |
| 2006.02.16 | දින 01 | -එම- |
| 2006.02.19 - 2006.02.24 | දින 06 | සුරාබදු පරීක්ෂකවරුන් |
| 2006.03.02 | දින 01 | වි.මෙ.ජ් / මත් ද්‍රව්‍ය නිලධාරීන් |
| 2006.03.05 - 2006.03.09 | දින 05 | ද්‍රවිඩ ජාතික සුරාබදු නිලධාරීන් |
| 2006.03.24 - 2006.03.27 | දින 04 | සුරාබදු සාජන්ට් මේජර්වරුන් / සුරාබදු සාජන්ට්වරුන් |
| 2006.03.26 | දින 01 | ස්කාගාර නිලධාරීන් |
| 2006.06.12 - 2006.06.16 | දින 05 | සුරාබදු නියාමකවරුන් |
| 2006.07.26 - 2006.07.27 | දින 02 | රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් |
| 2006.08.01 - 2006.08.03 | දින 03 | සහකාර සුරාබදු කොමසාරිස්වරුන් සුරාබදු අධිකාරීවරුන් |
| 2006.08.06 - 2006.08.11 | දින 06 | සුරාබදු පරීක්ෂකවරුන් |
| 2006.08.13 - 2006.08.18 | දින 06 | සුරාබදු නියාමකවරුන් |
| 2006.10.21 - 2006.10.26 | දින 06 | - එම - |
| 2006.11.16 - 2006.11.19 | දින 04 | - එම - |

7. යටිතල සංවර්ධනය (ගොඩනැගිලි/වාහන)

අ. ගොඩනැගිලි (බාහිර ප්‍රදේශ)

| කාර්යාලය | කාර්ය ස්වභාවය | වියදම (රුපියල්) |
|---|---|---|
| සුරාබදු කාර්යාලය, කළුතර | කාර්යාල සංකීර්යේ අළුත්වැඩියාවන් | 230,000.00 |
| සුරාබදු කාර්යාලය, අනුරාධපුරය | නාම පුවරුවක් සවි කිරීම | 4,500.00 |
| සුරාබදු කාර්යාලය, වවුනියාව | අළුත්වැඩියාවන් සහ පුළුල් කිරීම් | 89,500.00 |
| සංචාරක බංගලාව සහ සුරාබදු අධිකාරී කාර්යාලය, නුවරඑළිය | කාර්යාලයේ සිවිලිම් ගැසීම සහ සංචාරක බංගලාව වටා තාප්පයක් ඉදි කිරීම | 1,252,920.00 |
| නව ඉදි කිරීම් | | |
| සංචාරක බංගලාව, පොලොන්නරුව | ඉදි කෙරෙමින් පවතී | 5,427,000.00 |
| සුරාබදු ස්ථානය, මාදම්පේ | ඉදි කෙරෙමින් පවතී | 6,097,000.00 |

ආ. ගොඩනැගිලි (ප්‍රධාන කාර්යාලය - කොළඹ 2)

කොළඹ 2, සුරාබදු ප්‍රධාන කාර්යාලයේ අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් වෙනුවෙන් 2006 වර්ෂය තුල රුපියල් 2,916,402/33 ක් වැය කර ඇත.

ඇ. 2006 වර්ෂය තුලදී පහත සඳහන් වාහන මිලට ගෙන ඇත :-

i. ඉසුසු කෲ කැබ් - 05 - රුපියල් 11,212,500/=
ii. මිට්සුබිෂි ලාන්සර් කාරය- 01 - රුපියල් 3,195,000/=

8. **ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම**

2006.10.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මත්පැන් සඳහා වන බදු අනුපාතිකයන්ගේ වෙනසක් සිදු වුනි. මත්පැන් සඳහා අය කරන ලද සුරා බද්ද වැඩි කරන ලදි. නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය, අලෙවිය හා සම්බන්ධ ග්‍රහණ ද, වස, විෂ, අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණත යටතේ කරනු ලබන ග්‍රහණයන්ද කාර්යක්ෂමව පවත්වා ගෙන යන ලදි. මත්පැන් සහ දුම්කොළ භාවිතය පාලනය කිරීමේ අරමුණින්, රජය විසින් අංක 27/2006 දරණ දුම්කොළ හා මත්පැන් පිළිබඳ ජාතික අධිකාරී පනත හඳුන්වා දෙන ලදි. සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් නව ගැසට් නිවේදනයක් සම්පාදනය කර 2006.12.29 වන දින නිකුත් කරන ලදි.

9. **සුරාබදු ව්‍යුහය:**

| | 2005.12.09 දින සිට | 2006.10.05 දින සිට |
|---|---|---|
| ඉක්පුපාක, තල් අරක්කු, පොල් සහ පදම් කල අරක්කු සම්මත ලීටරයකට | 396/= | 421/= |
| විදේශීය මත්පැන් සම්මත ලීටරයකට | 525/= | 550/= |
| මධ්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු බියර් තොග ලීටරයකට | 37/50 | 37/50 |
| මධ්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි බියර් තොග ලීටරයකට | 53/50 | 53/50 |
| වයින් ලීටරයක් සඳහා | 250/= | 275/= |
| දුම්කොළ මත සුරා බද්ද කි.ග්‍රෑ එකකට | 10/= | 10/= |

මෑත වර්ෂවල දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් තත්ත්වය:

| වර්ෂය | ආදායම (රු. මිලියන) | වියදම (රු. මිලියන) | ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|
| 2000 | 6219.890 | 120.000 | 1.93 |
| 2001 | 6245.471 | 148.097 | 2.37 |
| 2002 | 8541.628 | 151.395 | 1.77 |
| 2003 | 10719.444 | 146.415 | 1.37 |
| 2004 | 13545.502 | 173.000 | 1.28 |
| 2005 | 16120.555 | 211.933 | 1.31 |
| 2006 | 20694.008 | 297.000 | 1.44 |

2005 වර්ෂයට වඩා 2006 වර්ෂයේ දී එකතු කරන ලද සුරාබදු ආදායම 28.3% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

10. ## ගිණුමේ නම : අරමුදල් ගිණුම

වර්ගය, නම සහ අංකය : සුරාබදු තැගි අරමුදල 6/60

| විස්තරය | මුල්‍ය කාර්ය සාධනය (රුපියල් '000) | | | | | භෞතික කාර්ය සාධනය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2006 වර්ෂය | | 2005 සත්‍ය | විචලනය | | නිමවුම (භාණ්ඩ/සේවා) | | 2006 වර්ෂයේ නිමවුම | | 2005 සත්‍ය | විචලනය | |
| | ඇස්තමේන්තුව | සත්‍ය | | ඇස්තමේන්තුව | 2005 සත්‍ය | වර්ගය/පංතිය | මිනුම | ඉලක්කය | සත්‍ය | | ඉලක්කය | 2005 සත්‍ය |
| ආදායම : ක්‍රියාකාරී | 22,000 | 91,245 | 39,499 | 69,245 | 51,746 | | | | | | | |
| : ක්‍රියාකාරී නොවන | | 6,785 | 3,457 | 6,785 | 3,328 | | | | | | | |
| **එකතුව** | **22,000** | **98,030** | **42,956** | **76,030** | | ග්‍රහණ සංඛ්‍යාව | ඒකක | 61 | 53 | 43 | 8 | 10 |
| පුනරාවර්තන වියදම | | | | | | | | | | | | |
| : ක්‍රියාකාරී | 24,530 | 40,854 | 22,639 | 16,324 | 18,215 | | | | | | | |
| : ක්‍රියාකාරී නොවන | 3,000 | 13,293 | 3,620 | 10,293 | 9,673 | | | | | | | |
| මුළු පුනරාවර්තන වියදම | **27,530** | **54,147** | **26,259** | **26,617** | 27,888 | | | | | | | |
| වියදම ඉක්මවූ ආදායම | (5,530) | 43,883 | 16,697 | 49,413 | 27,186 | | | | | | | |
| මූලධන වියදම | **60** | **48** | **44** | **12** | 4 | | | | | | | |
| ශුද්ධ අගය | (5,470) | 43,835 | 16,653 | 49,401 | 27,182 | | | | | | | |

11. ## ගිණුමේ නම : අත්තිකාරම් ගිණුම

ගිණුමේ නම සහ අංකය : 81101, 81102 - රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් ගිණුම

| විස්තරය | මූල්‍ය කාර්ය සාධනය (රුපියල් '000) | | | | | භෞතික කාර්ය සාධනය (000) | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Y 2006 | | 2005 සත්‍ය | විචලනය | | නිමවුම (භාණ්ඩ/සේවා) | | පවත්නා වර්ෂයේ නිමවුම | | නිමවුම 2005 | විචලනය | |
| | නියමිත අගය | සත්‍ය | | නියමිත අගය | සත්‍ය 2005 | වර්ගය/පංතිය | මිනුම | ඉලක්කය | සත්‍ය 2006 | | ඉලක්කය | 2005 සත්‍ය |
| උපරිම වියදම් සීමාව | 30,000 | 17198 | 15,382 | 12,802 | 1,816 | ණය | පුද්ගල | 500 | 180 | 212 | 320 | 32 |
| අවම ලැබීම් සීමාව | 13,150 | 19157 | 14,708 | 6,007 | 4,449 | | | | | | | |
| උපරිම හර සීමාව | 135,000 | 96409 | 98,369 | 38,591 | (1,960) | | | | | | | |
| උපරිම වගකීම් | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

12. <u>ගිණුමේ නම : විසර්ජන ගිණුම</u>

වැඩ සටහනේ නම සහ අංකය : බදු හා තීරු බදු පරිපාලනය - 10

නිෂ්පාදන බදු නීති පරිපාලනය - 01

| විස්තරය | මූල්‍ය කාර්ය සාධනය (රුපියල් '000) | | | | | භෞතික කාර්ය සාධනය (000) | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2006 වර්ෂය | | 2005 සත්‍ය | විචලනය | | නිමවුම (භාණ්ඩ/සේවා) | | 2006 වර්ෂයේ නිමවුම | | 2005 වර්ෂයේ නිමවුම | විචලනය | |
| | ඇස්තමේන්තුව | සත්‍ය | | ඇස්තමේන්තුව | 2005 සත්‍ය | වර්ගය/පංතිය | මිනුම | ඉලක්කය | සත්‍ය | | ඉලක්කය | 2005 සත්‍ය |
| <u>වියදම</u> | | | | | | | | | | | | |
| <u>පුනරාවර්තන වියදම</u> | | | | | | | | | | | | |
| පුද්ගල පඩිනඩි | 200,850 | 194,314 | 159,015 | 6,536 | 35,299 | එකතු කරන ලද ආදායම | රු. | 21,694,000 | 20,694,027 | 16,120,786 | 999,973 | 4,573,241 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 76,030 | 53,993 | 40,242 | 22,037 | 13,751 | ග්‍රහන | ඒකක | 61 | 53 | 43 | (8) | 10 |
| එකතුව | 276,880 | 248,307 | 199,257 | 28,573 | 49,050 | | | | | | | |
| මූලධන වියදම් | 53,437 | 48,388 | 12,676 | 5,049 | 35,712 | | | | | | | |
| මුළු වියදම | 330,317 | 296,695 | 211,933 | 33,622 | 84,762 | | | | | | | |

13. **ගිණුමේ නම :ආදායම් ගිණුම**

ආකෘතිය 'ඇ"

| විස්තරය | මූල්‍ය කාර්ය සාධනය (රුපියල් '000) | | | | | | | භෞතික කාර්ය සාධනය (000) | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2006.01.01 දිනට හිඟ ආදායම | 2006 වර්ෂය | | 2005 සත්‍ය | විචලනය | | 2006.12.31 දිනට හිඟ ආදායම | නිමවුම (භාණ්ඩ/සේවා) | | 2006 වර්ෂයේ නිමවුම | | 2005 වර්ෂයේ නිමවුම | විචලනය | |
| | | ඇස්තමේන්තුව (සංශෝධිත) | සත්‍ය | | ඇස්තමේන්තුව | 2005 සත්‍ය | | වර්ගය/පංතිය | මිනුම | ඉලක්කය | සත්‍ය | | ඉලක්කය | 2005 සත්‍ය |
| 10.02.40.01 සුරාබදු ආදායම | 426,708 | 21,658,000 | 20,660,504 | 16,086,302 | (997,496) | 4,574,202 | 467,582 | | | | | | | |
| 10.02.60.00 දුම්කොළ බදු ආදායම | 1,233 | 36,000 | 33,524 | 34,484 | (2,476) | (960) | 312 | | | | | | | |
| **මුළු ආදායම** | | **21,694,000** | **20,694,028** | **16,120,786** | **(999,972)** | **4,573,242** | **467,894** | | | | | | | |

14. **අභ්‍යන්තර විගණන ඒකකය :**

අභ්‍යන්තර විගණන ඒකකයේ ප්‍රධානියා වශයෙන් ගණකාධිකාරීවරයෙක් පත් කර එකී ඒකකය ශක්තිමත් කරන ලදී. අදාල වර්ෂය තුලදී මෙම ඒකකය විසින් සුරාබදු උප කාර්යාල 21 ක් ද, මත්පැන් නිෂ්පාදනාගාර 08 ක්ද, විගණනයට භාජනය කර ඇත. මුදල් අමාත්‍යාංශයෙන් ලද උපදෙස් අනුව සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් විගණන හා කලමනාකරණ කමිටුවක් ස්ථාපනය කරන ලද අතර, එහි මූලික රැස්වීම 2006.11.29 වන දින පවත්වන ලදී. ප්‍රධාන කාර්යාලයේ සේවය කරන සියළුම මාණ්ඩලික නිලධාරීන් මෙම කමිටුවේ සාමාජිකයන් වන අතර, මෙම දෙපාර්තමේන්තුවට විගණකාධිපති විසින් අනුයුක්ත කර ඇති විගණන අධිකාරීවරයා එහි නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී වේ. දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා මානව සම්පත් ඇතුළු අනෙකුත් සියළුම සම්පත් කාර්යක්ෂම ලෙස යොදවා ගැනීම දිරිමත් කරවීම මෙම කමිටුවේ වගකීම වන්නේ ය.

15. **භාණ්ඩ තොග පරීක්ෂණ :**

2005 වර්ෂයට අදාල සියළු භාණ්ඩ තොග පරීක්ෂණ කටයුතු 2006 වර්ෂය තුලදී අවසන් කරන ලදී.

16. **සුරාබදු හිඟ ආදායම් :**

2006 වර්ෂයේ අවසානය වන විට අයවීමට ඇති හිඟ සුරාබදු ආදායම් පිලිබඳ විස්තරයක් "ජේ" පරිශිෂ්ඨයේ ඇත.

17. **විගණන විමසුම් :**

අදාල වර්ෂය තුලදී විගණන විමසුම් 22 ක් ලැබුන අතර, ඉන් 19 කට පිලිතුරු සපයා ඇත.

18. **දෙපාර්තමේන්තු වත්කම් :**

දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි හා වත්කම් දැක්වෙන ලේඛණයක් " ඕ " පරිශිෂ්ඨයේ ඇත.

19. **වර්ෂය තුලදී භාවිතා වූ මත්පැන් බලපත්‍ර වර්ග:**

අ.

| | | |
|---|---|---|
| ර.බ් 1 | : | ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බ් ඒ | : | විදේශීය ස්ප්‍රිතු මෙරට නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බ් බී | : | කිරි පොන්ස සහ/හෝ වයින් නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බ් සී | : | රා හැර පොල් හෝ පොල් ආශ්‍රිත වෙනත් නිෂ්පාදිතයකින් පෙරන ලද ස්ප්‍රිතුවලින් විදේශ ස්ප්‍රිතු මෙරට සෑදීමට දෙන ලද බලපත්‍රය |
| ර.බ් 3 | : | තොග වෙළඳ බලපත්‍රය |
| ර.බ් 4 | : | සිල්ලරට විකුණුම් බලපත්‍රය |
| ර.බ් 6 | : | බියර් පෝටර් බලපත්‍රය |
| ර.බ් 7 | : | හෝටල් බලපත්‍රය |
| ර.බ් 8 | : | හෝටල් පියිකා බලපත්‍රය |
| ර.බ් 9 | : | විනෝද පියිකා බලපත්‍රය |
| ර.බ් 10 | : | දුම්රිය භෝජනාගාර බලපත්‍රය |
| ර.බ් 11 | : | ආපනශාලා බලපත්‍රය |
| ර.බ් 12 | : | තානායම් බලපත්‍රය |
| ර.බ් 13 ඒ | : | ක්‍රීඩා සමාජ / සමාජශාලා බලපත්‍රය |
| ර.බ් 14 | : | අවස්ථා බලපත්‍රය |
| ර.බ් 15 | : | විකුණන වේලාවන් දීර්ඝ කිරීම සඳහා දෙන අතිරේක බලපත්‍රය |

| | | |
|---|---|---|
| ර.බ් 16 | : | වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය |
| ර.බ් 17 | : | පරිපාක ස්ප්‍රීතු බලපත්‍රය |
| ර.බ් 18 | : | ඖෂධීය වයින් බලපත්‍රය |
| ර.බ් 19 | : | විශේෂ බලපත්‍රය |
| ර.බ් 22 ඒ | : | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍රය |
| ර.බ් 22 බී | : | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් ස්ථානීය පරිභෝජනය සඳහා බලපත්‍රය |

ආ. නිෂ්පාදනය බලපත්‍ර

පැසුනු නොපැසුනු මී රා මැදීම, බා ගැනීම සහ නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය

- ස්කාගාර බලපත්‍රය
- විනාකිරි බලපත්‍රය
- ස්ප්‍රීතු ශෝධනය කිරීම සංයෝග කිරීම, පදම් කිරීම පිලිබඳ බලපත්‍රය

ඇ. රා එකතු කිරීම සඳහා බලපත්‍රය

- එකතු කරන ස්ථාන බලපත්‍රය

ඈ. බෝතල්ගත කිරීම සඳහා බලපත්‍රය

- පැසවූ මත්පැන්
- පෙරූ මත්පැන්

ඉ. සහාය බලපත්‍රය

ඊ. කිතුල් ගස් පැසුණු රා නිෂ්පාදනය කර විකිණීමේ බලපත්‍රය

උ. විදේශ සංචාරක හෝටල් සහ ආපනශාලා බලපත්‍ර

| | |
|---|---|
| 'ඒ' ශ්‍රේණියේ හෝටල් | (ර.බ් 7)<br>(ර.බ් 8) |
| 'බී' ශ්‍රේණියේ හෝටල් | (ර.බ් 7)<br>(ර.බ් 8) |
| 'සී' ශ්‍රේණියේ හෝටල් | (ර.බ් 7)<br>(ර.බ් 8) |
| 'ඒ ' ශ්‍රේණියේ ආපනශාලා | (ර.බ් 11) |
| 'බී' ශ්‍රේණියේ ආපනශාලා | (ර.බ් 11) |
| 'සී' ශ්‍රේණියේ ආපනශාලා | (ර.බ් 11) |

ශ්‍රේණිය නොසලකා සංචාරක මණ්ඩලය අනුමත කල ස්ථාන (ර.බ් 22 බී)

ඌ ටෙන්ඩර් මගින් විකුණනු ලබන රා තැබෑරුම්

20. අදාල වර්ෂයේ මත්පැන් නිෂ්පාදකයෝ

1. සීමාසහිත ඩිස්ට්ලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා, අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ10.
2. සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සමාගම, වැලිසර, රාගම
3. සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ට්ලර්ස් සමාගම, කොතලාවල, කඩුවෙල
4. සීමාසහිත තිපොත් එක්ස්පෝ කම්පැනි, අංක 102, ශාන්ත ඇන්ඩෲ පාර, මෝදර, කොළඹ 15
5. සීමාසහිත ඒ.ඒ.එෆ් (පුද්ගලික) සමාගම, අංක 324, හයිලෙවල් පාර, ගලගෙදර, පාදුක්ක
6. සීමාසහිත මනෝරි ලංකා කම්පැනි, අංක 277/1, ජයමාලපුර, ගම්පොල
7. සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි, මිල්ලෑව, මොරගහහේන

8. සීමාසහිත රියෝ මාර්කටිං සර්විසස් (පුද්ගලික) සමාගම, අංක 7, පෙරුන්කුලිය මාවත, දංකොටුව
9. සීමාසහිත වයඹ ඩිස්ටිලරීස් ලංකා (පුද්ගලික) සමාගම, මල්කඩුවාව, කුරුණෑගල
10. සීමාසහිත ඇක්මී ලංකා කම්පැනි, අංක 73/1, පරණ පාර, හංවැල්ල
11. සීමාසහිත ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සහ සමාගම, මෙස්ටිය, වාද්දුව
12. සීමාසහිත පෙරිසිල් කම්පැනි, අංක 296/10, පාර්ක් පාර, කොළඹ 5
13. සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම, අංක 255/86, කොරතොට, කඩුවෙල
14. සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, අංක 25/20, මහවත්ත පාර, එගොඩ උයන, මොරටුව
15. සීමාසහිත ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, පස්සර පාර, විතීතගම, බදුල්ල
16. සමුපකාර ස්කාගාරය, පයාගල
17. හිඟුරාණ ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම, සමනබැද්ද, තිත්තපත්තර
18. තික්කම් ඩිස්ටිලරීස්, අල්වායි, පේද්‍රුතුඩුව
19. වලිකාමම් ඩිස්ටිලරීස්, වංකානෙයි
20. ග්ලෝබ් බ්ලෙන්ඩර්ස් (පුද්) සමාගම, මල්කඩුවාව, කුරුණෑගල
21. සීමාසහිත මැකලම් බෲවරි (පුද්ගලික) සමාගම, පර්ල් වතුයාය, මීගොඩ
22. සීමාසහිත යුනයිටඩ් බෲවරි සමාගම, මාවතගම
23. සීමාසහිත ලයන් බෲවරි සමාගම, අංක 254, කොළඹ පාර, බියගම

21. **නිෂ්පාදිත මත්පැන් ප්‍රමාණයන්**

අ. මොලැසස් අරක්කු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 222,751.200 | 89,647,980.20 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 1,328,273.468 | 542,072,950.38 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 82,767.100 | 33,174,544.10 |
| සීමාසහිත මනෝරි ලංකා සමාගම | 8,428.000 | 3,373,390.50 |
| සීමාසහිත රියෝ මාර්කටිං සර්විසස් පුද්ගලික සමාගම | 10,125.240 | 4,097,997.54 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 3,672.000 | 1,454,112.0 0 |
| වරනි | 21,747.620 | 8,792,172.02 |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සහ සමාගම | 11,893.353 | 4,763,100.67 |
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 76,753.000 | 30,486,285.50 |
| තික්කම් ඩිස්ටිලරීස් | 43,078.900 | 17,116,466.90 |
| වලිකාමම් ඩිස්ටිලරීස් | 189,528.666 | 76,854,199.67 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 902.133 | 337,060.46 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 9,927.900 | 3,951,593.40 |
| එකතුව | **2,009,848.580** | **816,121,853.34** |

ආ. පොල් සහ පදම් කල අරක්කු:

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔප් ශ්‍රී ලංකා | 3,475,490.366 | 1,398,097,005.94 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 76,437.600 | 30,929,942.10 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 558,547.767 | 223,917,486.78 |
| සීමාසහිත මනෝරි ලංකා සමාගම | 1,484.200 | 587,743.20 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 630,932.272 | 235,875,787.33 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 10,351.800 | 4,117,597.80 |
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 2,769.100 | 1,096,563.60 |
| සමුපකාර ස්කාගාරය | 7,125.900 | 2,835,541.40 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 1,004.848 | 397,919.71 |
| ඇක්මී ලංකා කම්පැනි | 18,628.200 | 7,515,669.70 |
| එකතුව | **4,782,772.053** | **1,905,371,257.56** |

ඇ. විශේෂ අරක්කු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඩිස්ට්ලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 29,359,608.335 | 11,803,052,406.91 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 585,662.199 | 234,221,280.80 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ට්ලරීස් සමාගම | 1,837,940.694 | 735,802,887.12 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 143,797.100 | 57,778,259.10 |
| සීමාසහිත මනෝරි ලංකා සමාගම | 120,566.000 | 48,506,351.00 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ට්ලරීස් සමාගම | 1,350,421.387 | 556,653,597.90 |
| සීමාසහිත තිපොත් එක්ස්පෝ සමාගම | 137,289,.900 | 55,271,492.90 |
| ක්ලැසික් නිශ්පාදකයෝ | 44,077.607 | 17,562,442.36 |
| හිඟුරාණ ඩිස්ට්ලරීස් සමාගම - දොම්පේ | 160,948.300 | 65,215,421.80 |
| සමුපකාර ස්කාගාරය | 50,864.700 | 20,430,578.70 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ට්ලරීස් සමාගම | 265,524.477 | 106,503,730.20 |
| ජේ.ජී.එෆ් (පුද්ගලික) සමාගම | 377,197.020 | 151,686,824.92 |
| සීමාසහිත රියෝ මාර්කටිං සර්විසස් පුද්ගලික සමාගම | 113,902.570 | 45,752,168.72 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ට්ලරීස් සමාගම | 507,398.100 | 203,427,127.60 |
| සීමාසහිත ඇක්මී ලංකා සමාගම | 301,221.600 | 120,740,071.10 |
| සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම | 107,256.528 | 43,221,305.32 |
| එකතුව | **35,463,676.517** | **14,265,825,946.45** |

22. දේශීය නිෂ්පාදිත විදේශීය මත්පැන්

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 37,351.200 | 19,912,905.00 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ට්ලරීස් සමාගම | 1,101,800.540 | 585,007,752.22 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ට්ලරීස් සමාගම | 713,028.939 | 380,143,619.65 |
| සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම | 721,445.230 | 383,800,239.40 |
| සීමාසහිත තිපොත් එක්ස්පෝ සමාගම | 2,556.400 | 1,363,150.00 |
| හිඟුරාණ ඩිස්ට්ලරීස් සමාගම - දොම්පේ | 3,128.200 | 1,643,297.50 |
| ශ්‍රී ලංකා ඩිස්ට්ලරීස් සමාගම | 105,149.285 | 53,046,376.20 |
| එකතුව | **2,684,459.794** | **1,424,917,339.97** |

23. ධාන්‍ය මත්පැන් (බියර්) මධ්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් ලීටර | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| මැකලම් බෲවරි සමාගම | 727,480.170 | 27,280,506.38 |
| යුනයිටඩ් බෲවරි සමාගම | 2,174,841.600 | 81,556,560.00 |
| ලයන් බෲවරි සමාගම | 21,895,029.075 | 821,063,590.31 |
| එකතුව | **24,797,350.845** | **929,900,656.69** |

24. ධාන්‍ය මත්පැන් (බියර්) මධ්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් ලීටර | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| මැකලම් බෲවරි සමාගම | 619,512.500 | 33,143,918.75 |
| යුනයිටඩ් බෲවරි සමාගම | 2,875,613.400 | 153,845,316.90 |
| ලයන් බෲවරි සමාගම | 18,531,669.575 | 991,444,322.28 |
| එකතුව | **22,026,795.475** | **1,178,433,557.93** |

25. වයින්

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| ලංකා වයින් පුද්ගලික සමාගම | 10,342.030 | 1,912,273.50 |
| සකේ වයින් (තිපොත් ලංකා සමාගම) | 364.900 | 87,232.50 |
| සෙන්ට් වයින් ලිමිටඩ් | 188.000 | 10,137.00 |
| එකතුව | **10,894.930** | **2,009,643.00** |

## 26. බෝතල් රා නිෂ්පාදකයෝ

බෝතල් ගත රා නිෂ්පාදකයන්ගේ නම් ද, නිෂ්පාදිත ප්‍රමාණයන් සහ අය කර ගන්නා ලද බදු මුදල් ද පහතින් දක්වා ඇත.

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| ඊගල් බෝතල් රා නිෂ්පාදනාගාරය | 473,855.000 | 113,725.20 |
| සිංහ බෝතල් රා නිෂ්පාදනාගාරය | 889,113.750 | 213,387.30 |
| කමාන්ඩර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 488,385.000 | 117,212.40 |
| නිව් කමාන්ඩෝ බෝතල් රා නිෂ්පාදකයෝ | 801,236.250 | 192,296.75 |
| ත්‍රී ලයන්ස් බෝතල් රා නිෂ්පාදකයෝ | 361,086.875 | 86,660.85 |
| මනෝරි ලංකා බෝතල් රා නිෂ්පාදකයෝ | 1013,993.750 | 243,358.50 |
| ටී.එස්.ආර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 800,852.500 | 192,204.60 |
| වංකානෙයි තල් සංවර්ධන සමූපකාරය | 101,038.750 | 24 249.30 |
| හෝස් පවර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 732,651.250 | 175836.30 |
| වයඹ සුපර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 549,107.500 | 131,785.80 |
| ගෝල්ඩන් ඊගල් බෝතල් රා නිෂ්පාදනාගාරය, මාදම්පේ | 738,051.250 | 177,132.30 |
| රියෝ මාර්කටිං බෝතල් රා නිෂ්පාදනාගාරය | 88,909.375 | 21,338.25 |
| එම්පයර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 190,263.750 | 45,663.30 |
| පූටින් ස්ටාර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 678,518.750 | 162,844.50 |
| සුපර් ස්ටාර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 305,276.860 | 73,266.40 |
| පයාගල පිරිසිදු පොල් රා බෝතල් නිෂ්පාදනාගාරය | 24,781.250 | 5947.50 |
| ගෝල්ඩන් ඊගල් බෝතල් රා නිෂ්පාදනාගාරය, කොළඹ | 69,387.500 | 16,653.00 |
| තල් රා - උයිලන්කුලම සමූපකාරය | 24435.000 | 4950.00 |
| එකතුව | 8,330,944.360 | 815,690.65 |

## 27. ස්ප්‍රීතු

පොල් රා වලින් නිෂ්පාදනය කරන ලද ස්ප්‍රීතු

| ස්කාගාරය | ශුද්ධ රා ලීටර | නිෂ්පාදිත ස්ප්‍රීතු නිරපේක්ෂ මධ්‍යසාර ලීටර |
|---|---|---|
| සීදුව ස්කාගාරය | 12,856,269.000 | 969,498.900 |
| සමූපකාර ස්කාගාරය | 2,978,183.000 | 218,971.500 |
| බේරුවල් ස්කාගාරය | 6,766,062.000 | 511,451.400 |
| මෙස්ටිය ස්කාගාරය | 2,470,754.000 | 201,288.100 |
| රොක්ලන්ඩ් ස්කාගාරය | 6,194,696.000 | 408,872.800 |
| වවුළුගල ස්කාගාරය | 219,694.000 | 16,477.100 |
| **එකතුව** | **31,485,658.000** | **2,326,559.800** |

තල් රා වලින් නිෂ්පාදනය කරන ලද ස්ප්‍රීතු

| ස්කාගාරය | ශුද්ධ රා ලීටර | නිෂ්පාදිත ස්ප්‍රීතු නිරපේක්ෂ මධ්‍යසාර ලීටර |
|---|---|---|
| වලිකාමම් ස්කාගාරය | 451,494.000 | 27,475.250 |
| තික්කම් ස්කාගාරය | 369,284.500 | 15,904.900 |
| වරණී ස්කාගාරය | 143,306.250 | 5,747.350 |
| **එකතුව** | **964,084.750** | **49,127.500** |

## 28. පරිපාක ස්ප්‍රීතු (අරක්කු නිෂ්පාදනය සඳහා)

| ස්කාගාරය | නිෂ්පාදන ප්‍රමාණය නිරපේක්ෂ මධ්‍යසාර ලීටර |
|---|---|
| සෙවනගල | 4,139,389.100 |
| පැල්වත්ත | 5,721,124.400 |
| **එකතුව** | **9,860,513.500** |

29. ස්වභාවය විකෘතිත ස්ප්‍රීතු ප්‍රමාණය

| ස්කාගාරය | නිෂ්පාදිත ප්‍රමාණය (ලීටර) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| පැල්වත්ත | 18,480.500 | 83,162.25 |
| එකතුව | **18,480.500** | **83,162.25** |

30. විනාකිරි නිෂ්පාදනය

බලපත්‍ර ලද ගස් ගණන, නිෂ්පාදිත විනාකිරි ප්‍රමාණය සහ විකුණුම් මිල (ඇ) පරිශිෂ්ඨයෙහි දැක්වේ.

31. දුම්කොළ බද්ද

2006 වර්ෂයෙහි නිකුත් කරන ලද දුම්කොළ ප්‍රමාණය සහ අදාල බදු මුදල මෙසේ ය.

| නිෂ්පාදිත ප්‍රමාණය (කි.ග්‍රෑ) | බදු මුදල (රු. ශත) |
|---|---|
| 3,260,275.80 | 2,602,758.00 |

32. විශේෂ මෙහෙයුම් ඒකකයේ කාර්යයන්

අ. <u>කොළඹ ඒකකය</u>

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අධීක්ෂණය යටතේ, සුරාබදු කොමසාරිස් (අපරාධ/පුහුණු) මගින් පාලනය වන, සුරාබදු අධිකාරීවරයෙකු යටතේ සුරාබදු ස්ථානාධිපති ඇතුළු සුරාබදු පරීක්ෂකවරුන් දෙදෙනෙකුගෙන් හා සෙසු නිලයන් දහසය දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුතුව සිටී.

දිවයින පුරා සුරා අපරාධ මර්දනය කිරීමේ වගකීම මෙම ඒකකයට පැවරී ඇත. ඒ අනුව, 2006 වර්ෂය තුල මෙම ඒකකය මගින් සිදු කල අපරාධ ග්‍රහණ ඇතුළු අනෙකුත් ග්‍රහණ පිළිබඳ විස්තරයක් පහත සඳහන් කර ඇත.

| | |
|---|---|
| කරන ලද මුළු ග්‍රහණ සංඛ්‍යාව | 2032 |
| නීති විරෝධී ස්ප්‍රීතු පෙරීම් | 147 |
| නීති විරෝධී ස්ප්‍රීතු ළඟ තබා ගැනීම් | 1244 |
| නීති විරෝධී ස්ප්‍රීතු විකිණීම හා ළඟ තබා ගැනීම් | 61 |
| නීති විරෝධී රා විකිණීම් හා ළඟ තබා ගැනීම් | 70 |
| නීති විරෝධී රා ළඟ තබා ගැනීම් | 53 |
| රජයේ අනුමත අරක්කු හා බියර් විකිණීම් (බලපත්‍ර රහිත) | 86 |
| අරක්කු ළඟ තබා ගැනීම් (බලපත්‍ර රහිත) | 30 |
| ගංජා ළඟ තබා ගැනීම් | 15 |
| හෙරොයින් ළඟ තබා ගැනීම් | 21 |
| නීති විරෝධී සිගරට් ළඟ තබා ගැනීම් | 12 |
| ග්‍රහණය කරන ලද ගංජා හේන් ප්‍රමාණය | 08 |

2006 වර්ෂය තුලදී මෙම ඒකකය මගින් සිදු කරන ලද වැටලීම්වලින්, අපරාධ වාර්තා සම්බන්ධයෙන් රජයට අයකර දුන් දඩ මුදල රුපියල් 151,887,750/- කි. බලපත්‍ර ස්ථාන සම්බන්ධයෙන් සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් රජයට අයකර දුන් සමථ ගාස්තු මුදල රුපියල් 12,717,600/- කි.

2006 වසරේ දෙපාර්තමේන්තුවේ මෙම ඒකකය මගින් ගංජා හේන් 08 ක් වැටලීමත්, නීති විරෝධී සිගරට් වැටලීම සිදු කිරීමටත්, එමගින් රජයට අයවිය යුතු විශාල මුදලක් රැක දීමටත්, වැඩිම වාහන සංඛ්‍යාවක් අත්අඩංගුවට ගැනීමටත් මෙම ඒකකයේ නිලධාරීන් සමත් වූ බවත්, එමගින් ඒකකයේ කාර්යය භාරය පිළිබඳ ජනතා ප්‍රසාදය ඉහල මට්ටමකින් පැවතුන බවත් පැහැදිලි වේ.

ආ. <u>මධ්‍යම පලාත් ඒකකය</u>

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ සුරාබදු කොමසාරිස් අපරාධ හා පුහුණු , සහකාර සුරාබදු කොමසාරිස් (මධ්‍යම පළාත) ගේ අධීක්ෂණය යටතේ සුරාබදු ස්ථානාධිපති ඇතුළු එක් සුරාබදු පරීක්ෂකවරයෙකු සහ සුරාබදු සැරයන්වරු දෙදෙනෙකු, සුරාබදු නියාමකවරුන් සය දෙනෙකු, කාන්තා සුරාබදු නියාමකවරියක් සහ සුරාබදු රියදුරෙකු ඇතුළු නිලධාරීන් දෙලොස් දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුක්තව සිටී. 2003 වර්ෂයේ ස්ථාපිත මෙම ඒකකය එවකට මධ්‍යම, ඌව, උතුරු, උතුරු මැද හා නැගෙනහිර පලාත්වල සක්‍රීය රාජකාරියේ යෙදී ඇත. 2004 වසරේ සිට මෙම ඒකකය සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ නියෝග හා උපදෙස් පරිදි දිවයින පුරාම විශේෂිත රාජකාරිවල නියුක්තව සිටී.

2006 වසරේදී සුරා වැටලීම් 1010 ක් සිදුකර පුද්ගලයින් 1009 ක් අත් අඩංගුවට ගෙන දඩ මුදල් ලෙස රුපියල් පණස් දෙලක්ෂ හැටඅටදහස් පන්සියයක් (5,268,500/-) රජයට අයකර දී ඇත. මේ සඳහා නීති විරෝධි ලෙස පෙරීම් මධ්‍යස්ථාන 48 ක් හා අක්කර 58 ක පමණ කංසා වැටලීම්, ජාවාරම්කරුවන් අත් අඩංගුවට ගැනීම් ද ඇතුලත් වන අතර, බදු නොගෙවන ලද සිගරට් 10120 ක් අත් අඩංගුවට ගැනීම ද ඇතුලත් ය. නීති විරෝධි සිගරට් සම්බන්ධයෙන් රුපියල් 105,000/- ක දඩ මුදලක් අයකර ගෙන ඇත.

දිවයින තුල බලපත්‍ර ස්ථාන 504 ක් කොන්දේසි කඩ කිරීම් සම්බන්ධයෙන් වැටලීම් කටයුතු කර කාර්මික අපරාධ වාර්තා 504 ක් ඉදිරිපත් කර ඇත. මින් රුපියල් 20,400,000/= ක සමථ මුදලක් රජයට අයකර දීමට සමත් වී ඇත.

2006 වර්ෂයේ මෙම ඒකකය මගින් දිවයින තුල විශාලම කංසා හේන් වැටලීම් 10 ක් සිදුකර ඇති අතර, ගංජා පැල 346,739 ක් විනාශ කරන ලදී.

33. නිෂපාදන මෙහෙයුම් ඒකකයේ කාර්යයන්

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ සුරාබදු කොමසාරිස් (අපරාධ සහ පුහුණු) මගින් පාලනය වන මෙම ඒකකයේ ජ්‍යෙෂ්ඨ සුරාබදු පරීක්ෂකවරයෙක්, සුරාබදු පරීක්ෂකවරයෙක් . කෝප්‍රල්වරියක්, කාන්තා සුරාබදු නියාමිකාවක් සහ සුරාබදු රියදුරු කෝප්‍රල්වරයෙක් අනුයුක්තව ඇත.

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, දිවයින පුරා විසිර පවතින සියළුම ස්කාගාර, අරක්කු, බියර්, රා සහ වයින් නිෂ්පාදනාගාරවල නිශප්පාදන කාර්යයන් අධීක්ෂණය කිරීමත්, එමගින් සුරාබදු ආදායම අයකර ගැනීම සහ දිවයින පුරා පිහිටි තොග වෙළඳ බලපත්‍ර (රබ් 03) පරීක්ෂාව සහ එහි පවතින වැරදි සම්බන්ධව කාර්මික අපරාධ වාර්ථා ඉදිරිපත් කිරීම මෙන්ම සුරාබදු නීතියට අනුකූලව ඒවා පාලනය විය යුතු ආකාරය සම්බන්ධව දැනුවත් කිරීමත් සහ නිරන්තර අධීක්ෂණයකට එම බලපත්‍ර ස්ථාන ලක් කිරීමත් ය.

තවද, මත්පැන් නිෂ්පානාගාර හා ග්‍රහණ තොරතුරු සම්බන්ධව සංඛ්‍යා ලේඛණ පවත්වා ගෙන යාමත්, කාර්මික අපරාධ වාර්ථාවලට අදාල තැගි මුදල් ගෙවීම සඳහා කටයුතු කිරීමත් මෙම ඒකකයේ අධීක්ෂණය යටතේ සිදුකර ගෙන යනු ලබයි.

2006 වර්ෂය තුල ඉහත සඳහන් බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය තුලින් පැවති වැරදි සම්බන්ධව කාර්මික අපරාධ වාර්ථා 51 ක් ඉදිරිපත් කර, ඒ සඳහා සමථ ගාස්තු මුදල් සහ රාජ සන්තක කරන ලද ස්ප්‍රිතු විකිණීමෙන් රුපියල් 19,471,549/75 ක ආදායමක් රජයට ලබා දී ඇත. ඉලක්ක ගතකර ඇති සුරාබදු ආදායම ලඟා කර ගැනීම සඳහා මෙම ඒකකය විසින් බදු ලබා ගන්නා බලපත්‍ර ස්ථාන නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම තුලින් අපේක්ෂිත බදු ආදායම් ඉලක්කය සපුරා ගැනීමට ප්‍රමුඛව දායක වී ඇත.

34. මත්ද්‍රව්‍ය ඒකකයේ කාර්යයන්

වස විෂ අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණත යටතේ නීතිය බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද මත්ද්‍රව්‍ය ඒකකය කොළඹ ඩී.ආර් විජේවර්ධන මාවතේ ක්‍රියාත්මක වේ. සුරාබදු අධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ සුරාබදු ස්ථානාධිපතිවරයෙකු ඇතුළු නිලධාරීන් විසි දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් මගින් මෙම ඒකකයේ කාර්යයන් මෙහෙයවනු ලබයි.

2006 වර්ෂයේදී ග්‍රහණ 723 ක් සිදුකර ඇති අතර, ඒ මගින් මත්ද්‍රව්‍ය අපරාධකරුවන් ලෙස පිරිමි 638 ක් හා ගැහැණු 85 ක් අත්අඩංගුවට ගෙන ඇත. මෙම ග්‍රහණ 723 න් 280 ක් හෙරොයින් සම්බන්ධවූ ඒවා වූ අතර, 429 ක් ගංජා සම්බන්ධ ග්‍රහණ විය. සිද්ධීන් 38 සඳහා අධිකරණය ඉදිරියේ නඩු පැවරුනු අතර, දඩ මුදල් වශයෙන් රුපියල් 1,491,050/= ක් අයකර ගෙන ඇත.

මීට අමතරව, මෙම වර්ෂය තුළදී අක්කර හතක කංසා හේන් ප්‍රමාණයක් ද විනාශ කරන ලදී. 2006 වර්ෂය තුල දී, හෙරොයින් ග්‍රෑම් 399 සහ මිලි ග්‍රෑම් 446 ක් ද, ගංජා කිලෝ ග්‍රෑම් 174 සහ ග්‍රෑම් 669 ක් අත් අඩංගුවට ගන්නා ලදී. තවද, මහේස්ත්‍රාත් අධිකරණය තුලින් විසඳු නඩු සංඛ්‍යාව 685 ක් වන අතර, මහාධිකරණයට ඉදිරිපත් කල නඩු සංඛ්‍යාව 38 කි.

## 35. සුරා අපරාධ

සමාලෝචිත වර්ෂය තුල නීති විරෝධී මත්පැන් උවදුර මැඩලීම සම්බන්ධ වැටලීම් ප්‍රමාණය වැඩිවී ඇත. මෙම වර්ෂය තුළදී ග්‍රහණ 56000 ක් ඉලක්ක කර තිබූ අතර, ග්‍රහණ 52583 ක් සිදු කරන ලදී. දඩ මුදල් වශයෙන් රුපියල් මිලියන 176.8 ක මුදලක් අය කර ගෙන ඇත.

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ විශේෂ නියෝගය මත, වෙසක් කාල සීමාව තුල දිවයින පුරා වැටලීම් සිදු කල අතර, සුරාබදු නියෝග උල්ලංඝණය කිරීම හේතුවෙන් බලපත්‍ර ස්ථාන කිහිපයක් මුද්‍රා තබන ලදී. කාර්මික අපරාධ වාර්තා සමථ ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂයේ දී රුපියල් 94,613,091/- ක් අයකර ගෙන ඇත.

## 36. පහරදීම් හා අවහිර කිරීම්

- ගාල්ල සුරාබදු ස්ථානයේ නිලධාරීන්ගේ රාජකාරිවලට තර්ජනය කිරීමක් හා පහර දීමක් සම්බන්ධයෙන් බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරා ඇත.

- රත්නපුර සුරාබදු ස්ථානයේ නිලධාරීන්ගේ රාජකාරිවලට බාධා කිරීමක් හා තර්ජනය කිරීමක් සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකුට එරෙහිව රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී.

- 2006.08.28 වන දින දී, කොළඹ විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් හට මැර කණ්ඩායමක් විසින් පහරදීමක් සහ අංක 62-0762 දරණ වාහනයට රුපියල් 175,000/- ක අලාභයක් සිදු කොට ඇති අතර, මේ සම්බන්ධයෙන් මීගමුව අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී.

## 37. මූල්‍ය කළමනාකරණය හා ප්‍රතිසංස්කරණ වැඩ සටහන

මෙම වැඩ සටහනේ අරමුණ වන්නේ දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලනය නවීකරණය කර ගැනීම හා මූල්‍ය කළමනාකරණ රාමුව ශක්තිමත් කර ගැනීම සහ මූල්‍ය ඌණතාවයන් පාලනය කිරීමට රජයට සහය වීමයි. සමාලෝචිත වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය තුලින් දෙපාර්තමේන්තුව ලබා ගත් ප්‍රගතිය පහතින් දැක්වේ.

අ. චර්යාධර්ම පද්ධතියක් පිලියෙල කර සියළුම නිලධාරීන් අතරේ බෙදා දෙන ලදී.

ආ. දෙපාර්තමේන්තුව ඉදිරියේ ඇති වත්මන් අභියෝග වෙනුවෙන් නව ආයතනික රාමුවක් සකසන ලදී.

ඇ. හඳුනාගත් සියළුම තනතුරු සඳහා රැකියා විස්තර පිලියෙල කරන ලදී.

ඈ. නව කාර්ය සාධාන පටිපාටියක් හඳුන්වා දෙන ලදී.

ඉ. පුහුණුවීම් අවශ්‍යතා පිලිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී.

ඊ. පරිඝණක 35 කින් යුතු නව පරිඝණකාගාරයක් ඉදි කරන ලදී. මූලික පරිඝණක දැනුම ලබා දීම සඳහා සෑම නිලධාරියකුටම අවශ්‍ය පුහුණුව ලබා දීම මෙහි අරමුණයි. 2006 නොවැම්බර් මස සිට මෙහි පරිඝණක පුහුණු පාඨමාලාවන් ආරම්භ කරන ලදී.

උ දෙපාර්තමේන්තු පටිපාටියන් විධිමත් කිරීම අරමුණු කොට ගෙන, නව දෙපාර්තමේන්තු නියෝග පොතක් නිර්මාණය කර සියළුම නිලධාරීන් අතරේ බෙදා දෙන ලදී.

ඌ අදාල නිර්දේශයන් අනුව, සුරාබදු ස්ථානයන් විසිරී තිබිය යුතු ආකාරය පිළිබඳව සමීක්ෂණයක් සිදු කරන ලදී. ඒ අනුව, නව සුරාබදු ස්ථාන 04 ක්, මීරිගම, කැබතිගොල්ලෑව, ඇඹිලිපිටිය හා මහව යන ප්‍රදේශවල 2006 වසරේදී ස්ථාපනය කරන ලදී.

එ. දෙපාර්තමේන්තු රාජකාරීන් පරිගණක ගත කිරීම අරමුණු කොට ගෙන, වසරක කොන්ත්‍රාත් පදනම මත, පරිඝණක උපදේශකවරයෙක් පත් කරන ලදී. දෙපාර්තමේන්තු වෙබ් අඩවියක් අගෝස්තු මස සිට ආරම්භ කරන ලදී. පරිඝණක ගත කල යුතු කාර්යයන් හඳුනා ගෙන ක්‍රියා කිරීම සඳහා පරිඝණක ඒකකයක් ස්ථාපනය කරන ලදී.

ඒ. දෙපාර්තමේන්තුව සඳහා මානව සම්පත් කළමනාකරණ සැලැස්මක් පිළියෙල කරන ලදී.

ඔ හිතකර කළමනාකරණ වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා දුක් ගැනවිලි , කළමනාකරණය පිළිබඳ ක්‍රමවේදයක් 2006.09.01 වන දින සිට හඳුන්වා දෙන ලදී.

ඕ. වෘත්තීය සමිති සහභාගිත්වයෙන් උසස් කිරීමේ පටිපාටියක් නැවත කෙටුම්පත් කරන ලදී. දෙපාර්තමේන්තුව සඳහා නව සේවා ව්‍යවස්ථාවක් පිළියෙල කිරීම ආරම්භ කරන ලදී.

# සමාප්තිය

සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද සුරාබදු ආදායම රුපියල් මිලියන 20694 කි. මෙය 2005 වර්ෂයට වඩා 28% ක වර්ධනයකි. සිදු කරන ලද මුළු වැටලීම් සංඛ්‍යාව 52583 කි. මේ අනුව, අදාල වර්ෂය තුලදී දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවීම ගැන සතුටු වෙමි.

දෙපාර්තමේන්තුවේ සාර්ථකත්වයට හේතු වූයේ සීමිත සම්පත් මනා ලෙස උපයෝගී කර ගනිමින් හා විධිමත් මානව සම්පත් කළමණාකරණයක් තුලින්, මෙහෙයුම් ක්‍රියාවලියේ ඇතිකල ගුණාත්මක වර්ධනයයි

ප්‍රතිපත්ති විධානයන් හා මාර්ගෝපදේශකත්වයන් සලසාදීමෙන් මාගේ ක්‍රියාකාරිත්වයට ශක්තිය ලබා දුන් අතිගරු ජනාධිපති තුමාටත්, ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමාටත්, දෙපාර්තමේන්තුව නිසි මග මෙහෙයවීමෙන් හා මාගේ කාර්යභාරය සාර්ථක කර ගැනීමට ජවය ලබා දුන් මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයාටත්, සම්බන්ධීකරණය හා නිරන්තර උපදෙස් දීමෙන් බාධක මග හරවා ගැනීමට දායකවූ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්ටත්, දෙපාර්තමේන්තුවේ කටයුතු සාර්ථක කර ගැනීමට නොයෙක් අයුරින් සහය දුන් මුදල් අමාත්‍යංශයේ සියළුම නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ලැබුන සහය අගය කරමි. තවද, දෙපාර්තමේන්තුව සමග සුහදව හා සම්පව කටයුතු කර, එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීමට සහය දැක්වූ ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව හා අනෙකුත් රාජ්‍ය ආයතනයන්ට මාගේ කෘතඥ පූර්වක ස්තුතිය පුද කර සිටිමි.

ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රතිපාදන සපයන මුල්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන විසින් මෙම දෙපාර්තමේන්තුවට ලබා දෙන අනගි සහය පිළිබඳව ස්තුතිය පිරිනමන අතර, මෙම දෙපාර්තමේන්තුවේ නවීකරණ වැඩ සටහන සාක්ෂාත් කර ගැනීම් වස් අදාල වසර පුරා එම ආයතනයේ ව්‍යාපෘති අධ්‍යක්ෂක සහ " ප්‍රයිස්වෝටර් හවුස් කූපර්ස් පුද්ගලික සමාගමේ උපදේශක මහතුන් විසින් දෙනු ලැබූ මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් මාගේ විශේෂ ස්තුතිය ඔවුනට පිරිනමනු කැමැත්තෙමි.

අවසන් වශයෙන් මාගේ කටයුතු සාර්ථක කර ගැනීමට සහය වෙමින් දෙපාර්තමේන්තු අරමුණු මුදුන්පත් කර ගැනීමට දායකවූ දෙපාර්තමේන්තුවේ සියළුම ශ්‍රේණිවල නිලධාරීන්ට මාගේ විශේෂ ස්තුතිය හිමිවිය යුතුය.

(පරාක්‍රම ඒකනායක බණ්ඩාර)
සුරාබදු කොමසාරිස් ජනරාල්